ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව
இலங்கை மனித உரிமைகள் ஆணைக்குழு
HUMAN RIGHTS COMMISSION OF SRI LANKA

මගේ අංකය / எனது இல. / My No.
ඔබේ අංකය / உமது இல. / Your No.
දිනය / திகதி / Date 2022 - 12.21

පැමිණිලි පාර්ශවය : ඒ. නඩරාජා මහතා,
පහල කොටස, හල්වතුර වත්ත,
බුලත්සිංහල.

වගඋත්තර පාර්ශවය : 1. ස්ථානාධිපති,
අපරාධ අංශය,
පොලිස් ස්ථානය,
බුලත්සිංහල.

2. පො.කො. 66782 ශ්‍රීමාල් මහතා,
පොලිස් ස්ථානය,
බුලත්සිංහල.

3. ස්ථානාධිපති,
පොලිස් ස්ථානය,
බුලත්සිංහල.

පැමිණිලි අංකය : HRC/1026/19

පැමිණිල්ල :-

ඉහත පැමිණිලිකරු විසින් මානව හිමිකම් කොමිෂන් සභාව හමුවේ පැමිණිල්ලක් ගොනු කරමින් සඳහන් කර ඇත්තේ, තමා හල්වතුර පදිංචි තිමල් ගුණරත්න මහතාගේ තේ වත්තේ 2019.03.28 වන දින දහවල් කාලයේදී වැඩ කරමින් සිටියදී බුලත්සිංහල පොලිසියේ පොලිස් නිලධාරි මහතෙකු යතුරු පැදියෙන් පැමිණ තමාව අත්අඩංගුවට ගෙන යතුරු පැදියේ දමාගෙන පොලිස් ස්ථානයට රැගෙන ගොස් පහරදුන් බවත්, මෙම පහරදීම නිසා හොරණ රජයේ රෝහලේ වාට්ටු අංක : 15 හි ප්‍රතිකාර ලබාගත් බවත්ය.

පැමිණිලිකරු 2019.08.02 වන දින කොමිෂන් සභාවෙහි පැවති පරීක්ෂණයේදී තම පැමිණිල්ල සම්බන්ධයෙන් වැඩිදුරටත් කරුණු දක්වමින් සඳහන් කර ඇත්තේ, 2019.03.28 වන දින තමා උපාලි



ප්‍රධාන කාර්යාලය / பிரதான அலுவலகம் / Head Office: 14, ආර්. ඒ. ද මෙල් මාවත, කොළඹ - 04. / 14, ஆர்.ஏ.த. மெல் மாவத்தை, கொழும்பு - 04. / 14, R.A. De Mel Mawatha, Colombo - 04.
සභාපති / தவிசாளர் / Chairperson: 011-2505451
ෆැක්ස් / தொலைநகல் / Fax: 011-2505541/ 74
ඊමේල් / மின்னஞ்சல் / e-mail: sechrcsl@gmail.com
දුරකථන / தொலைபேசி / Telephone: 94 -11-2505580 / 81 / 82
ලේකම් / செயலாளர் / Secretary: 011-2505521
ක්ෂණික / துரித அழைப்பு / Hotline: 1996
වෙබ් / இணையம் / Web: www.hrcsl.lk

නැමති අයගේ වැඩපලේ වැඩ කරමින් සිටියදී දහවල් 11.00 ට පමණ යතුරු පැදි දෙකකින් බුලත්සිංහල පොලිස් ස්ථානයේ නිලධාරීන් තිදෙනෙක් පැමිණ එක් නිලධාරියෙක් තමා වෙත පැමිණ කටඋත්තරයක් ගැනීමට අවශ්‍ය නිසා පොලිස් ස්ථානයට එන ලෙස දැන්වූ බවයි. එවිට තම වැඩපලේ හිමිකරු විසින් පැමිණිය හැකි බවට දන්වා ඇති නමුත් ඔවුන් තමාව එම යතුරු පැදියේ නංවාගෙන බුලත්සිංහල පොලිසියට රැගෙන ගොස් අපරාධ අංශයේ කාමරයක බිම වාඩි වන ලෙසට දැනුම්දුන් බවත්, ගුණසේකර මහතා තමාගේ කකුලේ වලලු කර කොටස පෑගෙන සේ හිටගත් අතර, තවත් නිලධාරීන් දෙදෙනෙක් උරහිසට නැග්ග බවත්, තවත් නිලධාරියෙක් ඇඟිලි වලට පොලු වලින් ගසා ඇඟිලි කැරකූ බවත්, අත් දෙකට මංචු දමා මේසය ලඟට ගෙන ගොස් ලණුවකින් අත් දෙක ගැට ගසා අත් දෙක සහ කකුල් දෙකයි අතරින් ලණුවක් දමා තමාව බාල්කයේ එල්ලූ බවයි. එවිට බාල්කය කඩා වැටුනු බවත්, ඉන්පසුව ඔවුන් නැවතී සිටි කාමරයට රැගෙන ගිය ගොස් නැවත බාල්කයේ එල්ලා පොල්ලකින් ශරීරයේ සෑම තැනකටම පහරදුන් බවත් ප්‍රකාශ කර ඇත. එසේ පැය **3** ක් පමණ එල්ලා තැබූ අතර, පසුව සිර මැදිරියට දමා පසුදින පොලිස් ස්ථානයේ රඳවා තබා ගත් බවත්, පසුව තම පුතා වන ශිවරාජා යන අය විසින් මතුගම පොලිස් අධිකාරී කාර්යාලයට ගොස් දැන්වූ බවත්, ඉන් දින **3** කට පමණ පසුව අධිකරණයට ඉදිරිපත් කර ඇප මත නිදහස් වූ බවත් දක්වා ඇත. එදිනම තමා හොරණ රෝහලට ඇතුලත් වී ප්‍රතිකාර ලබාගත් බවද සඳහන් කර ඇත.

පැමිණිල්ලේ සාක්ෂි :-

බුලත්සිංහල, හල්වතුර වත්ත පහළ කොටසේ පදිංචි ආරුමුගම් පාක්‍ය ලෙච්චමි යන අය දිවුරුම් ප්‍රකාශයක් ඉදිරිපත් කර ඇත. එම දිවුරුම් ප්‍රකාශයේ සඳහන් වන්නේ තම වැඩිමහල් සොහොයුරා වන ආරුමුගම් නඩරාජා කම්කරුවෙකු වශයෙන් හල්වතුර පදිංචි නිමල් ගුණරත්න මහතාගේ තේ වත්තේ වැඩ කරමින් සිටියදී 2019.03.28 වන දින දහවල් කාලයේදී බුලත්සිංහල පොලිස් ස්ථානයේ නිලධාරී මහතෙකු යතුරු පැදියෙන් පැමිණ රැගෙන ගිය බවට දැනගන්නට ලැබුණු බවත්, එදින සවස් කාලයේදී තමා බුලත්සිංහල පොලිස් ස්ථානයට ගිය බවත්, ආරුමුගම් නඩරාජා යන අය සිර මැදිරියේ රඳවා සිටි බවත්, ඔහු දැඩි වේදනාවකින් පීඩා විඳින බව තමාට නිරීක්ෂණය වූ බවත්, එක් අතක වැලමිටක් ලඟින් ඔසවා අල්ලාගෙන සිටි බවත්ය. තමා ඔහු සමග කථා කළ අතර, තමාව රැගෙන ගිය ශ්‍රීමාල් නිලධාරියා සහ තවත් නිලධාරීන් දෙදෙනෙක් ඉතා තදබල ලෙස පහරදුන් බවට ඔහු තමාට වෙත පවසා සිටි බවත් දක්වා ඇත. එසේම, ඔහුගේ පිට ප්‍රදේශය සහ උරහිස් වල පාද වල බත් කෙන්ද හා කලවා පෙදෙස් වල යම් මුගුරකින් පහරදුන් බවට ලක්ෂණ ඉතා පැහැදිලිව දර්ශනය වූ බවද සඳහන් කර ඇත.

පසුව 2019.03.29 දින උදේ 9.45 ට පමණ ජීප් රථයකින් නඩරාජා යන අයගේ නිවස අසලට පැමිණ සිටින බවට තමා දුටු බවත්, ආරුමුගම් නඩරාජා යන අයට අත් විලංගු දමා තිබූ බවත්, පසුව දොර කඩා නිවස ඇතුලට ගොස් නිවස පරීක්ෂා කළද කිසිවක් හමු නොවූ බවත්, නැවත ජීප් රථයේ නංවාගෙන රැගෙන ගිය බවට තමා දුටු බවත් සඳහන් කර ඇත. එම අවස්ථාවේදී තමාගේ සහෝදරයාගේ පුතෙකු වන සුබ්‍රමනියම් ගණපති යන අයගේ යතුරු පැදියේ නැගී තමාද ජීප් රථයේ

පසුපස ගිය බවත්, එසේ රැගෙන යන අතරතුරදී ජීප් රථයේ පසුපස සිටි නිලධාරීන් දෙදෙනෙකු නඩරාජා යන අයගේ හිසට, මුහුණට සහ බෙල්ලට පහරදුන් බව තමා දුටු බවද සඳහන් කර ඇත. පසුව මාර්තු මස 31 වන දින නඩරාජා යන අයව අධිකරණයට ඉදිරිපත් කිරීමෙන් පසුව ඇප මත නිදහස් වූ බව ද සඳහන් කර ඇත.

අයි. ගුණපාල යන අය විසින්ද මේ සම්බන්ධයෙන් දිවුරුම් ප්‍රකාශයක් ඉදිරිපත් කර ඇති අතර, එහි සඳහන් කර ඇත්තේ ඒ. නඩරාජා යන අය තමාගේ තේ ඉඩම එළි කරමින් සිටි බවත්, යතුරු පැදියකින් පුද්ගලයෙක් පැමිණ නඩරාජා යන අයට කථා කොට කඩෝව ලගට ටිකක් එන ලෙසට කථා කළ බවත්, එවිට 'ඔහු තමා සමග වැඩ නිසා නඩරාජාට යාමට නොහැකි බව' එම අය වෙත පැවසූ විට තමා පොලිසියේ යැයි පවසා නඩරාජාව යතුරු පැදියේ නංවාගෙන 2019.03.27 වන දින දහවල් 10.30 ට පමණ පොලිස් ස්ථානයට රැගෙන ගිය බවත්ය.. පසුව තමා සවස කෑම පාර්සලයක් ද රැගෙන පොලිස් ස්ථානයට ගිය බවත්, නඩරාජා යන අයට පහරදී කූඩුවේ දමා සිටිනු තමා දුටු බවත්, තමා නඩරාජාගෙන් 'ඇයි' දැයි කියා විමසූ විට මෝටරයක් ගත්තා යැයි කියා පහර දුන් බවට ප්‍රකාශ කළ බවත් සඳහන් කර ඇත.

පැමිණිලිකරුගේ අධිකරණ වෛද්‍ය වාර්තාව කොමිෂන් සභාව වෙත කැඳවා ඇති අතර, එම වාර්තාවට අනුව රෝගියා විසින් දෙන ලද කෙටි ඉතිහාසයේ "2019.03.28 සහ 29 දින වලදී බුලත්සිංහල පොලිසියේදී රාළහාමිලා තුන්දෙනෙක් බැටන් පොලු වලින් තමාගේ පිටට, අත් දෙකට සහ කකුල් දෙකට පහරවල් 15 - 20 ක් අතර ගැසූ බවට" දක්වා ඇත.

අධිකරණ වෛද්‍ය වාර්තාවේ තුවාල සම්බන්ධයෙන් සඳහන් වන්නේ බරපතල නොවන තුවාල 4 ක් ඇති බවයි.

1. 2cm ක දිගු අතට විහිදුනු සීරීම් තුවාලයක් පපුව පිටුපස ප්‍රදේශයේ උරහිසට පහලින් පිහිටීම.
2. 1cm ක දිගු අතට විහිදුනු සීරීම් තුවාලයක් වම් පසුපසෙහි ඇලපතෙහි පිහිටීම.
3. 1cm ක දිගු අතට විහිදුනු සීරීම් තුවාලයක් දකුණු පස ඇලපතෙහි පිහිටීම.
4. බඩ ප්‍රදේශයේ මුහුණතේ මෘදු වීමක් පිහිටීම.

**වගඋත්තරකරුවන්ගේ කරුණු දැක්වීම :-**

වගඋත්තරකරුවන් අත්අඩංගුවට ගැනීමට අදාළව තොරතුරු සටහන් පොත් වල උද්ධෘත සහිත වාර්තාවක් ඉදිරිපත් කර ඇත.

1 වන වගඋත්තරකරු පැමිණිල්ල සම්බන්ධයෙන් ප්‍රකාශ කර ඇත්තේ, බුලත්සිංහල පොලිස් ස්ථානයට 2019.03.27 වන දින වාත්තුකාරගේ රේණුකා දමයන්ති, අක්කර 150, හල්වතුර, බුලත්සිංහල යන අය විසින් හල්වතුරේ පදිංචි නිමල් යන අයගේ ඉඩමේ සවි කර තිබූ එම දෙදෙනාට

අයත් වතුර මෝටරය 2019.03.26 දින සොකරම් කර ඇති බවට පොලිස් ස්ථානයට ලැබී ඇති පැමිණිලි සම්බන්ධයෙන් කරන ලද විමර්ශනයේදී 2019.03.26 වන දින හල්වතුර ප්‍රදේශයේ පදිංචි තොටමුණ රාජා යන අය වතුර මෝටරය සවි කර තිබූ ප්‍රදේශයේ ඉඩම් ශුද්ධ කිරීම සඳහා පැමිණ සිටි බවත්, මීට පෙර ද මෙම පුද්ගලයා මෙම ඉඩම සුද්ධ කිරීමට පැමිණි අයෙක් බවත් අනාවරණය වූ බවයි. ඒ අනුව හල්වතුර වත්ත, පහළ කොටසේ පදිංචි ආරුමුගම් නඩරාජා යන අයව 2019.03.29 වන දින තමා විසින් අත්අඩංගුවට ගෙන 2019.03.31 දින මතුගම මහේස්ත්‍රාත් අධිකරණය වෙත යොමු කල බව දක්වා ඇත.

වගඋත්තරකරුගෙන් අසන ලද ප්‍රශ්න වලට පිළිතුරු ලබා දෙමින්, 2019.03.29 වන දින අදාල පැමිණිල්ල සම්බන්ධයෙන් විමර්ශනයක් සිදුකල බවත්, ඒ අනුව අදාල ස්ථානය පරීක්ෂාවට ලක් කල බවත් දක්වා ඇත. පැමිණිලිකරුවන් දෙදෙනාම ප්‍රකාශ කර සිටියේ වතුර මෝටරය සවි කර ඇත්තේ නිමල් මහතාගේ ඉඩමේ බවත්, මීට වසර 8 කට පමණ පෙර එය සවිකර ඇති බවත්, එසේම මෙම ඉඩමේ සේවය කර ඇත්තේ වෙනත් පුද්ගලයින් දෙදෙනෙක් බවත්, 2019.03.26 වන දින තොටමුණ රාජා පැමිණ එම ඉඩමේ වැඩ කර ඇති අතර, ඔහු මීට පෙර සොරකම් වලට සම්බන්ධ බවට වාර්තා වී ඇති නිසා එම අය මෙම සොරකමට සම්බන්ධ බවට සිතන බවට ප්‍රකාශ කල බවත් සඳහන් කර ඇත.

තවද, පැමිණිල්ලට අනුව පැමිණිලිකරුව අත්අඩංගුවට ගෙන ඇත්තේ, 2019.03.27 දින වන අතර, අත්අඩංගුවට ගැනීමෙන් පසුව අමානුෂික අන්දමින් පහරදුන් බවට සඳහන් කරන බැවින්, ඒ සම්බන්ධයෙන් වගඋත්තරකරු ප්‍රකාශ කර ඇත්තේ, ආරුමුගම් නඩරාජා යන අයව තමා අත්අඩංගුවට ගනු ලැබුවේ 2019.03.29 දින බවත්, පහරදීමක් නොකල බවත්ය.

2 වන වගඋත්තරකරු වශයෙන් නම් කර ඇති පො.කො. 66782 ටී.කේ.කේ. ශ්‍රීමාල් යන අය කොමිෂන් සභාව ඉදිරියේ ප්‍රකාශ කර ඇත්තේ, අදාල සිද්ධිය වනවිට තමා අපරාධ අංශයේ සේවය කල බවත්, වතුර මෝටර් දෙකක් නැතිවීම සම්බන්ධයෙන් පොලිස් ස්ථානයට ලැබී තිබූ පැමිණිලි සම්බන්ධයෙන් වැඩිදුර විමර්ශනය සඳහා යාමට අපරාධ අංශයේ ස්ථානාධිපතිවරයා තමාට දැනුම්දුන් බවත්, ඒ අනුව 2019.03.29 වන දින 60877 ඉඳුනිල් සහ 64425 ශාන්ත යන අය සමග පිටව ගොස් ස්ථානය පරීක්ෂා කොට පුද්ගලයන්ගෙන් ලද තොරතුරු මත ද, පැමිණිල්ලේ මෙම පැමිණිලිකරුගේ නම සඳහන් වී තිබූ බැවින්, කොස්ගහතැන්න කෝවිල අසලදී මෙම අයව අත්අඩංගුවට ගනු ලැබූ බවත්, ඔහු විසින් එය ප්‍රතික්ෂේප කිරීමෙන් පසුව ඔහුගේ නිවසට රැගෙන ගොස් නිවස පරීක්ෂා කල බවත්, එහිදී කිසිවක් හමු නොවූ බවත් සඳහන් කර ඇත. පසුව පොලිස් ස්ථානයට රැගෙන ගිය පසු අපරාධ අංශයේ ස්ථානාධිපතිවරයා ඔහුගෙන් ප්‍රශ්න කර පසු දින අධිකරණයට ඉදිරිපත් කල බවද කිසිදු පහරදීමක් සිදු නොකල බවද, මෙම අයව අත්අඩංගුවට ගනු ලැබුවේ 2019.03.29 වන දින බවද සඳහන් කර ඇත.

**නිරීක්ෂණ :-**

වතුර මෝටරයක් නැතිවීම සම්බන්ධයෙන් පොලිස් ස්ථානයට පැමිණිල්ලක් ලැබී ඇත්තේ, 2019.03.27 වන දින බවත්, එම පැමිණිල්ලට අනුව සැකකරුව අත්අඩංගුවට ගෙන ඇත්තේ, 2019.03.29 වන දින බවත් වගඋත්තරකරුගේ කරුණු දැක්වීම සහ තොරතුරු සටහන් පොත් වල සඳහන් වන බව නිරීක්ෂණය වේ.

පැමිණිල්ලේ සාක්ෂි වශයෙන් ඉදිරිපත් කර ඇති අයි. ගුණපාල යන අයගේ දිවුරුම් ප්‍රකාශය අනුව පැමිණිලිකරු අත්අඩංගුවට ගෙන ඇත්තේ, 2019.03.27 දහවල් 10.30 ට අනුව බව නිරීක්ෂණය වේ.

ආරුමුගම් පාක්‍යලෙච්චිමි යන අයගේ දිවුරුම් ප්‍රකාශයෙන් දක්වා ඇත්තේ, පැමිණිලිකරුව 2019.03.28 වන දින පොලිස් නිලධාරීන් විසින් නඩරාජා යන අයව යතුරු පැදියකින් රැගෙන ගිය බවත්, එසේම 2019.03.29 දින උදෑසන 9.45 ට පමණ නැවත පොලිස් ජීප් රථයෙන් නිවසට රැගෙන ආ බවත්, නිවස පරීක්ෂා කළ බවත්ය. ඒ අනුව එම සාක්ෂිය අනුවද නිරීක්ෂණය වන්නේ පැමිණිලිකරුව අත්අඩංගුවට ගෙන ඇත්තේ 2019.03.29 දින නොවන බවයි.

පැමිණිලිකරු අධිකරණ වෛද්‍ය පරීක්ෂණයේදී සඳහන් කර ඇත්තේ, 2019.03.28 සහ 29 දින වල බුලත්සිංහල පොලිස් ස්ථානයේ නිලධාරීන් තමාට බැටන් පොලු වලින් පිටට, අත්දෙකට සහ කකුල දෙකට පහරවල් 15 - 20 ත් අතර ප්‍රමාණයක් සිදුකළ බවයි. අධිකරණ වෛද්‍ය වාර්තාවට අනුව බරපතල නොවන තුවාල 4 ක් ඇති බව නිරීක්ෂණය වේ.

පැමිණිලිකරුව වගඋත්තරකරුවන් විසින් අධිකරණය වෙත ඉදිරිපත් කර ඇත්තේ, 2019.03.30 වන දින බවට නිරීක්ෂණය වේ.

වගඋත්තරකරුවන් විසින් පැමිණිලිකරුට විරුද්ධව මතුගම මහේස්ත්‍රාත් අධිකරණයේ නඩු අංක : 58805/19 යටතේ පවරා ඇති නඩුවේ දී වගඋත්තරකරුවන් විසින් ඉදිරිපත් කර තිබූ පැමිණිල්ල සම්බන්ධයෙන් වැඩිදුර වාර්තාවක් ඉදිරිපත් කර ඇති අතර, එහිදී දක්වා ඇත්තේ ප්‍රමාණවත් සාක්ෂි නොමැති බැවින්, සැකකරු මුදාහරින ලෙසයි.

**නිගමනය :-**

වෛද්‍ය වාර්තාවට අනුව බරපතල නොවන තුවාල 4 ක් ඇති බවට සඳහන් වේ. ඒ අනුව එය පැමිණිලිකරු දක්වන පහරදුන් ආකාරය සමග සැසඳෙන බැවින් වගඋත්තරකරුවන් විසින් පැමිණිලිකරුට පහරදීමක් සිදුකර ඇති බවට තහවුරු වේ.

ඒ අනුව 1978 ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 11 වන ව්‍යවස්ථාව මගින් සහතික කොට දී ඇති පැමිණිලිකරුගේ මූලික අයිතිවාසිකම් උල්ලංඝනය වී ඇති බවට පරීක්ෂණයෙන් අනතුරුව තිගමනය කරනු ලැබේ.

එසේම පැමිණිලිකරුව වගඋත්තරකරුවන් අත්අඩංගුවට ගෙන ඇත්තේ, 2019.03.29 දින බවට වාර්තා කර ඇතත්, පැමිණිල්ලේ ඉදිරිපත් කර ඇති සාක්ෂි වලට අනුව ගම්‍ය වන්නේ, පැමිණිලිකරුව අත්අඩංගුවට ගෙන ඇත්තේ 2019.03.27 හෝ 28 යන දිනයන් වලින් එකකදී බවයි. ඒ අනුව 2019.03.28 වන දින අත්අඩංගුවට ගැනීමක් සිදුකර තිබුණද, මෙම පුද්ගලයා අධිකරණය වෙත ඉදිරිපත් කර ඇත්තේ, 2019.03.30 දින බැවින්, අපරාධ නඩු විධාන සංග්‍රහයේ විධිවිධාන වලට අනුව අත්අඩංගුවට ගන්නා සැකකරුවෙකුව විමර්ශන අවසන් වීමෙන් පසුව පැය 24 ක් නොඉක්මවන කාලයකදී අධිකරණයට ඉදිරිපත් කළ යුතු වේ.

තවද, මෙම පැමිණිල්ලේ ඉදිරිපත්වී ඇති සාක්ෂි අනුව නියමිත කාලය ඉක්මවා මෙම පැමිණිලිකරුව පොලිස් ස්ථානයේ රඳවා තබා ගැනීම තුලින් පැමිණිලිකරුගේ 1978 ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 13(2) මගින් ආරක්ෂා කර ඇති මූලික අයිතිවාසිකම ද උල්ලංඝනය වී ඇති බවට නිගමනය කරනු ලැබේ.

එසේම, පැමිණිල්ලේ ඉදිරිපත් වී ඇති තොරතුරු වලට අනුව වතුර මෝටරයක් නැතිවීම සම්බන්ධයෙන් පොලිස් ස්ථානයට ලද පැමිණිල්ල මත පැමිණිලිකරුව අත්අඩංගුවට ගෙන ඇති බවත්, අත්අඩංගුවට ගැනීමට පෙර අදාළ පැමිණිල්ල සම්බන්ධයෙන් පොලිසිය විසින් තිසි විමර්ශනයක් සිදුකර නැති බවත්, හුදු පැමිණිල්ලක් මත පමණක් මෙම අත්අඩංගුවට ගැනීම සිදුකර ඇති බවත්, නිරීක්ෂණය වේ. අපරාධ නඩු විධාන සංග්‍රහයේ 32 වගන්තිය ප්‍රකාරව "හුදු පැමිණිල්ලක් මතම යම් පුද්ගලයෙක් අත්අඩංගුවට නොගත යුතු බවත්, අදාළ පැමිණිල්ල සම්බන්ධයෙන් පොලිසිය විසින් තිසි විමර්ශනයක් සිදුකර එය තහවුරු කර ගැනීමෙන් පසුව එම අත්අඩංගුවට ගැනීම සිදුකළ යුතු බවත්" දැක්වේ. මේ අනුව මෙම අත්අඩංගුවට ගැනීමේ දී පොලිසිය විසින් තිසි විමර්ශනයක් සිදුකර නොමැති බවට තහවුරු වේ. ඒ අනුව 1978 ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් සුරක්ෂිත කර ඇති 13(1) ව්‍යවස්ථාවද පැමිණිලිකරු සම්බන්ධයෙන් උල්ලංඝනය වී ඇති බවට මානව හිමිකම් කොමිෂන් සභාව නිගමනය කරනු ලැබේ.

**නිර්දේශය =:**

ඒ අනුව 1978 ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 11 වන ව්‍යවස්ථාව සහ 13(1) ව්‍යවස්ථාවේ සඳහන් පැමිණිලිකරුගේ මූලික අයිතිවාසිකම් උල්ලංඝනය වී ඇති බවට අනාවරණය වී ඇති බැවින්, අදාල වගඋත්තරකරුවන් සම්බන්ධයෙන් විනය පියවර ගැනීම සඳහා පොලිස්පතිවරයා විසින් පියවර ගත යුතු බවට මෙයින් නිර්දේශ කරනු ලැබේ.

2023.01.23 වන දිනට පෙර මෙකී නිර්දේශය ක්‍රියාත්මක කර ඒ සම්බන්ධ වාර්තාවක් කොමිෂන් සභාව වෙත ලැබීමට සලස්වන ලෙස 1996 අංක 21 දරණ ශ්‍රී ලංකා මානව හිමිකම් සභා පනතේ 15 (2) වන වගන්තිය ප්‍රකාරව වගඋත්තරකරුවන් වෙත දන්වමු.

එසේම එකී නිර්දේශය ක්‍රියාත්මක වීම හෝ නොවීම සම්බන්ධව පැමිණිලිකරු විසින්ද ඉහත දින සිට සතියක කාලයක් තුළ කොමිෂන් සභාවට දැනුම් දිය යුතු වන අතර, එදිනට පෙර අදාල දැනුම්දීම සිදු නොකරන්නේ නම් පසුව ඉදිරිපත් කරනු ලබන ඉල්ලීම් සම්බන්ධයෙන් සලකා නොබලන බවද වැඩිදුරටත් දන්වමු.

අනුසූයා ෂන්මුගනාදන්,
කොමසාරිස්,
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව.

Ms. Anusuya Shanmuganathan
Commissioner
Human Rights Commissioner of Sri Lanka

ම.හේ නිමල් කරුණාසිරි,
කොමසාරිස්,
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව.

Dr. M.H. Nimal Karunasiri
Commissioner
Human Rights Commission of Sri Lanka

පිටපත :- 01. අමාත්‍යතුමා,
මහජන ආරක්ෂක අමාත්‍යාංශය,
14 වන මහල, සුහුරුපාය,
බත්තරමුල්ල.

02. පොලිස්පතිතුමා,
පොලිස් මූලස්ථානය,
කොළඹ.

03. සභාපති,
ජාතික පොලිස් කොමිෂන් සභාව,
බණ්ඩාරනායක අනුස්මරණ සම්මන්ත්‍රණ ශාලාව
කොළඹ 07.

B/-